# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
### සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1454/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 21/11/2023<br>පැය 0725 |

## මාධ්‍ය නිවේදනය

### ශ්‍රී ලංකා පොලිසියට බොක්ෂිං තරඟ ජයග්‍රහණයක්.



ශ්‍රී ලංකා බොක්ෂිං සංගමය විසින් සංවිධානය කරන ලද "ක්ලිෆර්ඩ් කුසලාන බොක්ෂිං තරඟාවලිය" 2023.11.13 වන දින සිට 2023.11.17 වන දින දක්වා කොළඹ රාජකීය විද්‍යාලයේ මාස් බොක්ෂිං එරීනා කවයේදී පැවැත්විණි.

ඉහත තරඟාවලිය සඳහා ක්‍රීඩා කණ්ඩායම් 12 ක් නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 169 දෙනෙකු පමණ සහභාගී වූ අතර, ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 13 දෙනෙකු ද සහභාගි වී පහත ජයග්‍රහණ ලබාගෙන ඇත.

- **රන් පදක්කම් 02**

පො.කො. 90705 ගයාන් රත්නසිරි
කා.පො.කො. 12566 ජී.ඩී.අයි. සෙව්වන්දි

- **රිදී පදක්කම් 03**

පො.කො. 100475 එච්.පී.එම්. හඳුවල

කා.පො.කො. 13077 ආර්.පී.ඩී. රාජපක්ෂ
කොන්ත්‍රාත් ක්‍රීඩිකා පී.එම්. විදානගමගේ

- **ලෝකඩ පදක්කම් 05**

පො.කො. 90870 ආර්.පවේන්ද්‍ර
කා.පො.කො. 12652 බී.එම්.එම්.ඒ. ගුණතිලක
කා.පො.කො .12988 ජී.ඩබ්.ජී.සී. තාරුකා
කා.පො.කො. 12995 ඒ.එම්.ඩී.කේ. අත්තනායක
කොන්ත්‍රාත් ක්‍රීඩික ආර්.ඒ.ඩී. මධුෂංක

- තරඟාවලියේ දක්ෂතම පරාජිත ක්‍රීඩකයාට හිමි කුසලානය - කොන්ත්‍රාත් ක්‍රීඩිකා පී.එම්. විදානගමගේ විසින් දිනා ගන්නා ලදී.

ශ්‍රී ලංකා පොලිස් බොක්ෂිං කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ලයනල් ගුණතිලක මහතාද, ලේකම් ලෙස පොලිස් අධිකාරි කේ.ඒ.ඒ. කටුගම්පල මහතා ද කටයුතු කරනු ලබන අතර, පොලිස් බොක්ෂිං කණ්ඩායමේ කළමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක ලක්මාල් නිශාන්ත සහ පුහුණුකරු ලෙස පොලිස් පරීක්ෂක එම්.පී. සමීර කරුණාරත්න යන නිලධාරින් කටයුතු කරනු ලබයි.

මෙම අවස්ථාවට අදාල ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**